# මසුරුකමෙන් යුතු භික්ෂුවට ප්‍රථම ධ්‍යානය උපයා ගෙන වසන්නට නොහැකිය

## පඨම ඣාන සූත්‍රය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, අඞ්ගුත්තර නිකාය 3 - පිටු අංක 446 - 447)

මහණෙනි, මේ මසුරුකම් පහකි.

කවර පහක් ද යත්;

ආවාස කෙරෙහි මසුරුකම

පවුල් කෙරෙහි මසුරුකම

ලාභ කෙරෙහි මසුරුකම

වර්ණනාවන් කෙරෙහි මසුරුකම සහ

ධර්මය කෙරෙහි මසුරුකම වෙයි.

මේ මසුරුකම් පහ ප්‍රහාණය නොකර ප්‍රථම ධ්‍යානය උපයා ගෙන වසන්නට නොහැකි වෙයි.